# <u>ප්‍රසම්පාදන දැන්වීම</u>

# <u>පලන ලද වියළි දර මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කැඳවීම - 2019</u>

# <u>ශ්‍රී ලංකා යුද්ධ හමුදාව</u>

1. 2019 ජනවාරි මස 01 දින සිට 2019 දෙසැම්බර් මස 31 දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් යුද්ධ හමුදා කඳවුරු 50 ක් වෙත පලන ලද වියළි දර සැපයීම පිණිස කොළඹ 03, තැ:පෙ: 553, බාලදක්ෂ මාවතේ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ප්‍රසම්පාදන කැඳවනු ලැබේ. ප්‍රසම්පාදන අයදුම්පත් 2018 සැප්තැම්බර් මස 10 දින 1000 පැය දක්වා පමණක් නිකුත් කරනු ලබන අතර, ප්‍රසම්පාදන භාර ගැනීම 2018 සැප්තැම්බර් මස 11 දින 1000 පැයට අවසන් වේ. ප්‍රසම්පාදන විවෘත කිරීම ඉන් අනතුරුව සිදුකරනු ලබන අතර, එම අවස්ථාවේදී අයදුම්කරු හෝ අයදුම්කරුගේ අනුමත නියෝජිතයකු හට සහභාගි විය හැකිය.

**<u>සැපයීම් කඳවුරු</u>**

| | | |
|---|---|---|
| අනුරාධපුර | කොක්එලිය | මන්නාරම |
| අයියකච්චි | කොස්ගම | මහනුවර |
| අම්පාර | කෝපායි | මත්තෙගොඩ |
| අල්ලකන්තලේ | ගජසිංහපුර | මයුරපුර (නාගර්වැව) |
| අඹේපුස්ස | තාරාවිකුලම් | මාන්කුලම් |
| ඇඹිලිපිටිය | තුනුක්කායි | මාදුරුඔය |
| උල්පත්වැවගම | ත්‍රිකුණාමලය | මිරුසුවිල් |
| උකුවෙල | දියතලාව | මුලතිව් |
| ඔඩ්ඩුසුඩාන් | දොඹගොඩ(කළුතර) | මුරුක්කණ්ඩි |
| කරන්දෙනිය | පනාගොඩ | යාලපලටුපාන |
| කල්අඩි | පරාක්‍රමපුර | වව්නියාව |
| කල්ලාර් | පුදුකුඩුඉරුප්පු | වාලච්චේන |
| කන්කසන්තුරය | පුනානි | වාකරේ |
| කාවන්තිස්සපුර | පුත්තලම | වීරවිල |
| කැළණිය | පුනරින් | විල්පිට(කඹුරුපිටිය) |
| කුරුවිට | පේදුරුතුඩුව | වෙල්ලම්කුලම් |
| කොහොඹගස්හන්දිය | බුත්තල | |

2. ප්‍රසම්පාදන අයදුම්පත් කොළඹ 03, ගාලු මුවදොර ටෙරසය, දකුණු පෙදෙස, යුද්ධ හමුදා මූලස්ථානයේ, සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාගත හැකි අතර, ඒ සඳහා අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත, කඳවුරේ පිහිටි අධ්‍යක්ෂ - මුදල් වෙත එක් එක් කඳවුරක් සඳහා ආපසු නොගෙවනු ලබන රු:2,500.00 මුදලක් තැන්පත් කර අදාළ රිසිට් පත ඉදිරිපත් කළ යුතුය. (චෙක්පත් භාරගනු නොලැබේ)

3. ප්‍රසම්පාදන බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ **" පලන ලද වියළි දර සැපයීම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව 2019 වසර "** යනුවෙන් සඳහන් කර මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් සභාපති, යුද්ධ හමුදා ප්‍රසම්පාදන කමිටුව, උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව, යුද්ධ හමුදා මූලස්ථානය, තැ:පෙ: 553, බාලදක්ෂ මාවත, කොළඹ 03. වෙත එවීමට හෝ යුද්ධ හමුදා ගුවන් ටිකට් පත් අලෙවි මධ්‍යස්ථානය, පාසන් පාර, කොළඹ 02. යන ලිපිනය වෙත පැමිණ, එහි තබා ඇති දේශීය මිලදී ගැනීම්වලට අදාළ ප්‍රසම්පාදන බහාලනයට යොමු කළ හැකිය.

4. අයදුම්කරුවන් වෙතින් ප්‍රසම්පාදන මිල ගණන් සමග පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

අ. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය. (සහතික කරන ලද ඡායාස්ථ පිටපතක්)

ආ. ආපසු නොගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පත් මුදල් ගෙවා ඇති බවට නිකුත් කරන ලදුපත.

ඇ. පසුගිය වසර තුනෙහි ආදායම් බදු විගණනය කරන ලද විගණන වාර්තා.

ඈ. ඉල්ලුම්කරු විසින් පවත්වාගෙන යන බැංකු ගිණුමකට අදාළ බැංකු ප්‍රකාශය.

ඉ. ඉටුකරන ලද සේවාව සනාථ කිරීම සඳහා පිළිගත හැකි සහතික ඉදිරිපත් කළ යුතුය.

ඊ. වත්කම් හා මුදල් ස්ථාවරත්වය සනාථ කරනු වස් පළාතේ දිසා ලේකම්/ප්‍රාදේශිය ලේකම් විසින් නිකුත් කරන නියමිත ආකෘතිපත් (පොදු 170) මගින් එක් එක් කඳවුරක් වෙනුවෙන් රු: 200,000.00 කට නොඅඩු වත්කම් සහතිකයක්ද ඉදිරිපත් කළ යුතුය. මෙම සහතිකය ප්‍රසම්පාදන භාරගන්නා අවසාන දිනට දින 30 ක් ඇතුළත ලබාගත් එකක් විය යුතුය.

5. ඉල්ලුම්කරුවන් විසින් ප්‍රසම්පාදන අයදුම්පත ඉල්ලා සිටිමේදී සේවය සැපයීම සඳහා අයදුම් කරනු ලබන ස්ථාන සඳහන් කළ යුතුය.

6. අදාළ අවශ්‍යතාවට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වෙත ඕනෑම අයදුම්පතක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ඇත.

7. ප්‍රසම්පාදන පත්‍රිකා මුදල් ගෙවීමකින් තොරව කොළඹ 03, ගාලු මුවදොර ටෙරසය, දකුණු පෙදෙස, යුද්ධ හමුදා මූලස්ථානයේ, සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයේදී රජයේ වැඩ කරන වේලාවන් තුළදී පමණක් පරීක්ෂා කර බැලිය හැක.

8. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වැඩි විස්තර කොළඹ 03, ගාලු මුවදොර ටෙරසය, දකුණු පෙදෙස යුද්ධ හමුදා මූලස්ථානයෙහි සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාගත හැක.

දූරකථන අංක : 011-2302568, 011-2302569

**යුද්ධ හමුදාධිපති**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය
තැ:පෙ:553
බාලදක්ෂ මාවත
කොළඹ-03